*ප්‍රශ්නය : ඔබ වහන්සේටත් අවස්ථාව ලැබිලා තියෙනවා ජාත්‍යන්තර ඇත්දැකීම් ලබන්න. විදේශ රට වල සංචාරය කර පවතින තත්ත්වය දෙස බලන්න. ලෝකය එන්න එන්න ඉදිරියට ගමන් කරනවා. අප්‍රිකාවේ දුර්වලව තිබූ රටවල් වුවත් අද යම්කිසි මට්ටමකින් ඉදිරියට යන්න උනන්දු වෙනවා. නමුත් අපට තවමත් දියුණු වෙන්න නොහැකිවෙලා. මෙයට කාරණාව කුමක්ද?*

පිළිතුර : ශ්‍රී ලංකාව නිදහස ලබලා වෙලා දැන් අවුරුදු පනස් ගණනක්. මේ කාලය සමග සංසන්දනාත්මකව ලෝකයේ අනෙක් රටවල් ලබා ඇති ප්‍රගතිය දෙස බැලුවිට පිටරට යන හැම වාරයක් පාසාම මට කණගාටුවක් ඇති වෙනවා. අපිට වඩා බොහෝම නොදියුණු තත්ත්වයක තිබූ රටවල් විශාල ප්‍රගතියක් ලබා තිබෙනවා. මෙරට දේශපාලනය තුළ තිබෙන අවුල් වියවුල් සහගත තත්ත්වය එතැනදී මම දකින ප්‍රධානම කාරණාවයි. අපි නිදහස ලබා ගත් දින සිටම එකිනෙකා පදරවලා තව පිරිසක් බලයට පත් වන්න අරගලයක යෙදී සිටියා.  අපි අතර ජාතික ප්‍රතිපත්තියක් නැහැ. ඉතාම නොදියුණු රටවල් වශයෙන් පැවතුන දකුණු අප්‍රිකාව වගේ රටවල් අද ක්‍රමයෙන් ඒ රට වලට ස්වභාවික සම්පත් උපයෝගී කරගෙන සංවර්ධනය වෙමින් පවතිනවා. ඒ වගේම ආසියාවේ සමහර රටවල්. අවුරුදු විසිපහකට පමණ පෙර මැලේසියාව හා ලංකාව සංසදන විට එතරම් වෙනසක් දක්නට තිබුණේ නැහැ. අද ඒ රටේ ඇති දියුණුව දෙස බලන විට මැලේසියාවයි, ලංකාවයි අහසට පොළව වගේ වෙනස්. අපි අපේ මිනිස්සුන්ගේ මානසිකත්වය දියුණු කරන්න ක්‍රියා කළේ නැහැ. කාලයක් වහල් මානසිකත්වයෙන් සිටියා. අපි ආණ්ඩුව නෙමෙයි. මේ නිසා ආණ්ඩුවේ ඒවා නැති වුවාට කමක් නැහැ. ආණ්ඩුවේ ඒවා හොරකම් කළාට කමක් නැහැ කියන හැඟීම බොහෝ කාලයක් යනතුරු මිනිස්සුන් තුළ තිබුණා. ඒ නිසා ''ආණ්ඩුව කියන්නේ අපි'' කියන මානසිකත්වය විශේෂයෙන් රජයේ වැඩ කරන සේවකයන්ගේ, රජය සමග ගනුදෙනු කරන මහජනයාගේ හැඟීම් දියුණු වුනා මද බවයි මගේ අදහස.

*ප්‍රශ්නය : අපේ ඉතිහාසය දෙස බලන විට එයට එක කාරණාවක් පෙනෙන්නට තිබෙනවාද? ඔබ වහන්සේ මැලේසියාව, දකුණු අප්‍රිකාව ගැන කථා කළා. ඒ සමාජ වලට සමගියෙන් ප්‍රශ්න දිහා බලන්නත්, අවශ්‍ය වේලාවට දේශපාලනයට ඇතුල් වෙන්නත්. අනෙක් වේලාවට සමාජය ගැන හිතන්න පුළුවන් වුණා. නමුත් අපට ඒ දෙය කරන්න බැරි වුණා. ඒ ඇයි?*

පිළිතුර : අපි ඉතිහාසය ගැන උදම් අනමින් සිටිනවා. එදා ජනතාව අපේ රට කියන හැඟීමෙන් වැඩ කරන්න ඇති. ඒ නිසා තමයි අපිට අද ශ්‍රී ලාංකිකයන් ශ්‍රේෂ්ඨ ජාතියක් බව පෙන්වන්න යමක් ඉතිරි වෙලා තියෙන්නේ. නමුත් අපි පරාධීන බවට පත් වු පසු අපි අතර තිබු බේද භින්න වැඩි දියුණු වුණා. අප විවිධ කලාප, විවිධ ජනකොටස්, ආගමික වශයෙන් බේද භින්න වීම නිසා රට ගැන තිබුන හැඟීම් ක්‍රමයෙන් ඈත් වුනා. ඒ වගේම අප අතර යම් යම් වරප්‍රසාද හිමි පන්ති බිහි වෙන්න පටන් ගත්තා. බොහෝ දුරට නිදහසින් පසු අපේ රට කියන හැඟීම පදනම් කරගෙන ආරම්භයේදීම තුළදීම සිදු විය යුතුව තිබූ යම් කාර්ය භාරයක් ඉටු වුණේ නැහැ. ඒ නිසා නිදහස ලැබුදා සිටම අප අතර මත භේද ඇති වුණා. කොටසක් පනහට පනහ ඉල්ලන්න පටන් ගත්තා. යම් යම් භාෂා ගැටළු අපි අතර ඇති වුණා. ජාතික කොඩිය, ජාතික ගීය යන මේ හැම දෙයක් ගැනම ගැටළු ඇති වුණා.

ඉන්දියාව අපිට වඩා විශාල වශයෙන් බේද භින්නතා තිබෙන රටක්. විවිධත්වයක් තිබෙන සංකීර්ණ රටක්. නමුත් ඉන්දියාව තුළ ආරම්භයේ සිටම යම් තීරණ අර ගත්තා. රජින තව දුරටත් අපේ රටේ නායිකාව නොවන බවට ඉන්දියාව එඩිතර තීරණයක් ගත්තා. ජනාධිපති කෙනෙක් පත් කර ගන්න බවට තීරණය කළා. නමුත් අපට ඒ තීරණ ගන්න බොහෝ කාලයක් ගියා. අප නිදහස ලබා ගත්තත්, තව දුරටත් බ්‍රිතාන්‍යයෙන් නොයෙක් ආශිර්වාද ලබා ගත්තා. අපේ පසුබිම තුළ ඒ දේවල් තිබෙනවා. ඒ නිසා ක්‍රමයෙන් හැම දෙයක්ම දේශපාලනීකරණය වෙන්න පටන් ගත්තා. යම් රටක

සියලු දේ දේශපාලනීකරණය වෙනවානම්, දේශපාලනය දූෂිත, අස්ථාවර වීමත් සමඟ ඒ රටේ ප්‍රගතිය වැටෙනවා.

සමහර රටවල දේශපාලන අස්ථාවරතාවය තිබෙනවා. නමුත් ආර්ථිකය ඒ වගේ වෙන්නේ නැහැ. උදාහරණයක් වශයෙන් ප්‍රංශය ගෙන බලමු. ආණ්ඩුවක් අවුරුද්දක්වත් තිබුණේ නැති එක් කාලයක් තිබුණා. මාස හතෙන් අටෙන් ආණ්ඩු වෙනස් වුණා. පසුව දිගොල්ඩ් කියන සෙනෙවියා නැවතත් පැමිණ රටේ ජනාධිපති වෙලා දේශපාලන ස්ථාවර බව නැවත ගොඩ නැගුවා. පසුව ප්‍රංශයේ ආර්ථිකය දියුණු වුනා. ඉතාලියේත් මේ වගෙයි. දේශපාලන ඇඟිලි ගැසීම් නොමැතිව ව්‍යාපාරිකයන්ට ව්‍යාපාර කරගෙන යන්න ඒ රටේ නිදහස තිබෙනවා. රජය ප්‍රතිපත්ති සකස් කරන අතර අනෙකුත් අංශ වල අයට ඒ ඒ කාර්යයන් කරන්න ප්‍රමාණවත් නිදහසක් තිබෙනවා. නමුත් ලංකාවේ බැලූ විට හැම දෙයටම දේශපාලනය ඇතුළු වෙලා. මෑත කාලයේ දළදා මාලිගාවේ දියවඩන නිලමේතුමා පත් කරන්න පවා සමහර දේශපාලනඥයන් ඇඟිලි ගැසීම්, රාජ්‍ය මට්ටමෙන් බලපෑම් කර තිබුණා. අපේ රට ඒ තරමටම දුර ගිහිල්ලා. අපේ රට පසුබෑමකට ලක් වුණේ ඒ නිසා තමයි.

***ප්‍රශ්නය : ඔබ වහන්සේ ප්‍රංශය, ඉතාලිය ගැන කථා කළා. ඒ රටවල ව්‍යවස්ථාව, පාලන ක්‍රමය ඉදිරියට අවේ ඒ රට තුළින්මයි. අපි බ්‍රිතාන්‍යයෙන් ප්‍රජාතන්ත්‍රවාදය ගැන ඉගෙන ගත්තා. නමුත් අපට අපේම කියලා ක්‍රමයක් බිහි කරන්න බැරි වුණා. ඒ ගැන ඔබ වහන්සේගේ අදහස?***

පිළිතුර : යටත් විජිත යුගයේ අධිරාජ්‍ය විරෝධී ව්‍යාපාර තිබුණා. සමාජවාදය, මාක්ස් වාදය ආදී අදහස් ලංකාවට ආවා. ඒවාත් එංගලන්තය වගේ බටහිර රට වලට ගිය අපේ අය හැරල්ඩ් ලෙක්සි වගේ අයගෙන් ඉගෙන අපට කියා දුන්නා. රුසියාවේ හෝ චීනයේ අත්දැකීම් අනුව නෙවෙයි. ඒ සමාජවාදී ව්‍යාපාර තුළ අපට අධිරාජ්‍යවාදය ගැන, ධනපතියන් හංග වේවා, ඔවුන්ගේ

ධනය කොල්ල කා ගත්තාට කමක් නැහැ කියන අදහස් අපට ආවා. සමාජවාදය හොඳයි. සමාජවාදී ව්‍යාපාරයෙන් පමණයි මේ රට දියුණු කරන්න පුළුවන් කියන එක්තරා මතය ඇති වුණා. සමාජයේ තවත් කොටසක් නිදහසින් අපට ලැබුන දේ අනුව ඒ රාමුව තුළම සිටම ධනවාදි ක්‍රමය තුළින් රට දියුණු කරන්න පුළුවන් යන මතය තුළ සිටියා. රුසියාව හෝ චීනය විප්ලව කළ ආකාරයට අපේ රට දියුණු කරන්න බැහැ. අපේ රටේ ප්‍රවේණි දාසයන් සිටියේ නැහැ. මහා විශාල ඉඩම් හිමියන් සිටියේ නැහැ. විප්ලවයන් ඇති වු සමාජ තුළ තිබුණ ආකාරයේ විශාල සුරාකෑම් අපේ රට තුළ තිබුණේ නැහැ. නමුත් ඒ න්‍යාය ඒ ආකාරයෙන්ම අපේ රටේ මිනිසුන් අතර ප්‍රචලිත කරන්න වෑයම් ගත්තා. එයින් ආණ්ඩු බිහි කරන්න, ප්‍රතිපත්ති හදන්න, සැලසුම් කරන්න ගත් ව්‍යායාමය අපේ සංස්කෘතියට ගැලපෙන්නේ නැහැ.

රටේ චෛත්‍ය හදලා තියෙන ගඩොල් වලින් මිනිසුන්ට ගෙවල් හදලා දුන්නාම් මීට වඩා ප්‍රයෝජනයි කියලා ඇතැමෙකුට කියන්න පුළුවන්. නමුත් අවුරුදු දෙදහස් ගණනක් තිස්සේ මෙම චෛත්‍ය සංස්කෘතිය තුළ හැදුණු ජනතාවකට ඒ පණිවිඩය බොහෝම රළුයි.

මේ වගේ අදහස් ගැන අපි සාකච්ඡා කළේ නැහැ. එකතු වුනේ නැහැ. නිදහස ලබා ගන්න අපි විවිධ දේවල් කළා මිස, නිදහස ලැබීමත් සමග, ඉන් ඉදිරියට සූදානමක්, සැලැස්මක් තිබුණේ නැහැ. ඉන්දියාවේ නිදහස් ආණ්ඩුක්‍රම පනත පවා සකස් කළේ ඒ රටේ ක්ෂුද්‍රයන් ලෙස සලකා ඉවත් කළ සමාජයේ ජීවත් වු අම්බ්‍රිෂ්කාර් මහතායි. ඔවුන් රට වෙනුවෙන් ක්‍රියා කළා. සැලකුවේ ඒ මනුස්සයාගේ කුලය, ගෝත්‍රය පිළිබඳ නෙමෙයි. ඔහුගේ ඥාණය පිළිබද තමයි. එතුමා පසුව බුද්ධාගම වැළඳගත්තා. මේ වගේ කරුණු බලන විට එතැන දී ලංකාවේ කුමක් හෝ අඩුවක් වුණා.

*ප්‍රශ්නය : අද ඉන්දියාවේ අගමැතිතුමා සික්. ජනාධිපතිතුමා මුස්ලිම්.. බලවත්ම පුද්ගලයා ඉතාලියානු කතෝලික කාන්තාවක්. නමුත් රටට එය දරා ගන්න*

*හැකි වෙලා. නමුත් අපට මේ වගේ දෙයක් ගැන හිතන්නවත් බැහැ. ඒ වෙනස කුමක්ද?*

පිළිතුර : නිදහස ලබා ගත් අවස්ථාවේ සිට අපි අතර ඇති වු වෙනස්කම් නැති කරගෙන ක්‍රියා කරන්න අවශ්‍ය යම් නායකත්වයක් අපිට ලැබුණේ නැහැ. ගාන්ධිතුමා ඉන්දියානු නිදහස් ව්‍යාපාරය පිටු පස සිට ඉන්දීය ජනතාව තුළ විශාල මානසික විප්ලවයක් කළා. ගාන්ධිතුමා එයට පාවිච්චි කළේ අවිහිංසාව. එයට අවි ආයුධ භාවිතා කළේ නැහැ. ඉන්දියානු ජාතිකත්වය ගොඩ නැගුවා. එස්. මහින්ද හාමුදුරුවෝ, පියදාස සිරිසේන ආදි වශයෙන් වු අපේ ලේඛකයෝ කථා කළා. එහිදී ඔවුන් ක්‍රියා කළේ ජාති වාදි වශයෙන් නොවෙයි ක්‍රියා කළේ. ''සිංහලයින් අවදිවව්'' කියන පාඨය සඳහන් කළ නමුත් සියලු ලාංකිකයන් කියන සංකල්පය පැමිණියා මදි. මුල් යුගයේ සුළු වශයෙන් තිබුණ බේද හින්න, කල් යත්ම දේශපාලනයේ බල තෘෂ්ණාව සමඟ එකතු වෙලා තවත් වැඩි වුණා. සුළු ජාතීන් කණ්ඩායම් වශයෙන් සංවිධාන වී වෙලා ඒ අයගේ බලය ඒ තුළ රඳවා ගන්න උත්සාහ කළා.

*ප්‍රශ්නය : ඉතිහාසය තුළ කිහිප වතාවක්ම අපිට වැරදිලා තිබෙනවා. අනාගයේදී හෝ මේ ගමන හරි ආකාරයෙන් යන්න කළ යුත්තේ කුමක්ද?*

පිළිතුර : ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ මන්ත්‍රයක් වගේ නිතරම මතුරනවා. දැන් මිනිස්සුන්ට එය එපා වෙලා. කවදාවත් මේ තත්ත්වය තුළ ස්ථාවර ආණ්ඩුවක් ගොඩ නගන්න බැහැ. අපේ ඡන්දය අපතේ යන මට්ටමට පත් වෙලා. මහජනතාවගේ පරමාධිපත්‍ය මේ ඡන්දය තුළ තියෙන බව සඳහන් කරන් නමුත් අද ඡන්දය අවලංගු කාසියක් බවට පත් වෙලා. අපි ඡන්දය දුන්නාට අපේ අවශ්‍යතා අනුව රට ගොඩනගන්න පුළුවන් ආණ්ඩුවක් පත් වෙන්නේ නැහැ. ඒ නිසා කවර හෝ උපක්‍රම මගින් බලය ගැට ගහගෙන යන ආණ්ඩුවල ලක්ෂණ තමයි අද මේ රට තුළ තියෙන්නේ. දේශපාලනඥයන්ට

පමණක් රට භාර දී ජනතාව පැත්තකට වී සිටියහොත් ''අන්තෝ ජටා - බහි ජටා'' කියන්නා වගේ තවත් අවුලෙන් අවුලට පත් වෙනවා.
මේ යන ක්‍රමය හරහා ඉදිරියේදීවත් ආලෝක ධාරවක් වැටෙයි කියලා හිතා ගන්න බැහැ.

සුනාමි ඛේදවාචකය තුළින් නැඟී සිටින්න නම් සියලු දෙනාම එකමුතු වීම අවශ්‍යයි යන විශාල හැඟීමක් ජනතාව තුළ ඇති වුණා. ඔවුන් මේ තුළින් දෙමළ-සිංහල ගැටුම සමථයකට පත්වෙයි කියලා බලාපොරොත්තු වුවා. දේශපාලනඥයන් අතර තිබෙන මේ ඇණකොටා ගැනීම් නැතිවෙයි කියලා කල්පනා කළා. නමුත් නිසි ආකාරයෙන් කළමණාකරනය කර ගන්නත්, ආණ්ඩුවටත්, විපක්ෂයේ ඉන්න අයටත් ඒ වෙනුවෙන් සාර්ථකව ක්‍රියාකාරි වන්නටත් නොහැකි වුණා.

***ප්‍රශ්නය : අපට එය කර ගන්න නොහැකි වුණේ ඇයි? සමාජය තුළත් මේ පිළිබඳ විශාල බලාපොරොත්තුවක් තිබුණා.***

පිළිතුර : මේ තුළින් ප්‍රයෝජන ගන්න යම් යම් අවස්ථාවාදි කණ්ඩායම් සූදානම් වුණා. රජයේ ක්‍රියාකාරිත්වය නිසා රජය කෙරෙහි පැහැදීමෙන් ජාත්‍යන්තර ප්‍රජාව විශාල වශයෙන් ආධාර ලැබෙන බව පෙන්වන්න රජය උත්සාහ කළා. වෙනත් වෙනත් කණ්ඩායම්, ස්වේච්ඡා සංවිධාන තමන්ගේ ශක්තිය පෙන්වන්න උත්සාහ කළා. නමුත් අවසානයේ අද වෙනතුරු ඒ අයට සහන සැලසීමේදී ඇති වන ගැටලු නිසි ආකාරයෙන් විශ්ලේෂණය වෙලා නැහැ. සුනාමි ආපදා කළමණාකරන යාන්ත්‍රණයක් සකසන්න ගොස් ප්‍රශ්න ගැටලු ඇති වුණේත් ඒ නිසා. රට සංවර්ධනය කිරීමට, රට ගොඩ නගන්න ජාතික ප්‍රතිපත්තියක්, වැඩපිළිවෙලක් ඇතිව අඩුම වශයෙන් අවුරුදු දෙකක්වත් අපේ දේශපාලන න්‍යාය පත්‍ර පැත්තකට දමා ජාතික න්‍යාය පත්‍රයකට අප වැඩ කළ යුතුයි කියලා යම් කිසි තීරණයක් ගැනීම අවශ්‍යයි. එක් එක් අයගේ දේශපාලන න්‍යාය වලින් මදකට ඈත් වී, ප්‍රායෝගිකව රටේ

දැවෙන ප්‍රශ්න මොනවාද කියා හඳුනාගෙන ක්‍රියා කළ යුතුයි. සංවර්ධනය ඇති බාධා මොනවාද? රටේ මානව සම්පත් වැඩි දියුණු කළ යුත්තේ මොන ආකාරයෙන්ද? හැමදාම අපේ ආත්ම ගෞරවය ආධාර වලට පාවා දෙමින්, විජාතික ප්‍රතිපත්ති වලට එකඟ වෙමින් කටයුතු කරනවාද? මෙන්න මේ සියලු දේ පිළිබඳව එක් තීරණයකට පැමිණිය යුතුයි.

ජාත්‍යන්තර ආධාර දෙන කණ්ඩායම් වලට වහල් වෙලා අප හැමදාම ජීවත් වෙන බවට ජනතා විමුක්ති පෙරමුණ හැමදාම චෝදනා කරනවා. තවත් කොටසක් කියනවා ජාත්‍යන්තර ආධාර නොමැතිව අපට පවතින්න හැකියාවක් නැහැ කියලා. අද ජාත්‍යන්තර ආධාර ගත් සමහර රටවල් කිසිවෙකුටත් ගැති නොවී, තමන්ගේ අවශ්‍යතාවයන් හඳුනාගෙන කටයුතු කරනවා. ලංකාව වැනි දුප්පත් රටකට විදේශ ආධාර නොමැතිව සංවර්ධන වෙන්න බැහැ කියන එක ඕනෑම පොඩි දරුවෙකුට වුවත් තේරුම් ගත හැකි කාරණයක්. නමුත් එතැනදී අපිට ජාතික ප්‍රතිපත්තියක් තියෙන්න අවශ්‍යයි. පාර්ලිමේන්තුව වුවත් අද රටේ සංවර්ධනට අදාල යෝජනා සාකච්ඡා කරනවාට වඩා, රටේ නොයෙක් ආරවුල් ගැන මතභේද ඇති කරන විවාද සඳහා කාලය ගත කරන ආයතනයක් බවට පත් වෙලා.

***ප්‍රශ්නය : සමහර රටවල ආණ්ඩුව දුර්වල වීම වැනි අර්බුදකාරි ප්‍රශ්න මතු වන විට අන්තවාදි, අධිරාජ්‍යවාදි බලවේග මතුවෙන අවස්ථා දකිනවා. අපේ රටේත් මෙය විය හැකියි. සිවිල් සමාජය උනන්දු වෙනවා මෙය හදා ගන්න. රටේ ස්වාමින්වහන්සේලා, වගකිව යුත්තන් හා ප්‍රභුවරුන් එකතු වෙලා ''මෙය දැන් ඇති. අපි දැන් හරි ගමනක් යමු'' කියා පාලකයන්ට යම් බලපෑමක් කරනවානම් කොහොමද?***

පිළිතුර : සිවිල් සමාජයත්, දේශපාලනඥයා යටතට පත් වන ස්වරූපයක් අද දක්නට තිබෙනවා. ව්‍යාපාරික ප්‍රජාව පිළිබඳ සලකා බැලුවහොත්, දේශපාලනඥයන්ට නොසලකා හැරියහොත්, ඔවුන් බැහැර කළහොත්

ව්‍යාපාර කරගෙන යාමට නොහැකි වේයැයි ඔවුන් හිතනවා. ඒ නිසා ව්‍යාපාරික ප්‍රජාව විවෘතව ඉදිරිපත් වීම අඩුයි. ඇතැම් කලාකරුවන් විප්ලවවාදි අදහස් ඇතිව ක්‍රියාකරනවා. තවත් අය දේශපාලනඥයන්ට ගැතිව කටයුතු කරනවා. රටේ සිටින අනෙකුත් වෘත්තිකයන් පවා දේශපාලනඥයන්ගේ ආවරණයකින් තොරව ශක්තිමත්ව, තනිවම කටයුතු කරන තත්ත්වයට පත්වෙලා නැහැ. ඒ නිසා වෙනත් රටවල් සමඟ සංසන්දනය කරන විට අපේ රටේ සිවිල් සමාජය තුළ එක්තරා ආකාරයක දුර්වලතාවයක් තිබෙනවා. සාමාන්‍ය ජනතාව ශක්තිමත් කරන්න තිබෙන හැකියාව බොහෝ දුරට අඩුවෙලා. මේ නිසාම කිහිප වතාවක් තරුණ කැරලි ඇති වුණා. මේ ප්‍රජාතන්ත්‍රවාදි ක්‍රමය තුළ අපට සහනයක්, යහපතක් වෙන්නේ නැහැ කියා ඔවුන් කල්පනා කළා විය හැකිය. මේ පිළිබඳ සැහැල්ලුවෙන් සැලකුවහොත් සන්නද්ද අරගලයක් කළ යුතුයි කියන මතය තවත් වර්ධනය වෙන්න පුළුවන්. මා සඳහන් කරන්නේ. මේ සඳහා අනුබල දෙන ආකාරයේ වචනයක් නෙමෙයි. වෙනත් රටවල් තුළ ඇති වු තත්ත්වයන් දෙස බැලු විට එවැනි දෙයකට ගමන් කරන බව පෙනෙනවා. අවධියෙන් සිට බුද්ධිමත්ව සිවිල් සමාජ වැසියන් වශයෙන් කටයුතු කිරීම මේ නිසා අවශ්‍යම කාරණයක්.

***ප්‍රශ්නය : ඔබ වහන්සේ සඳහන් කළා වගේ මේ සඳහා විසඳුමක් ලැබුණේ නැතිනම් අපේ තරුණ සමාජය නොයෙක් පැති වලට යනවා. 1971, 1983 හා 1987 ඒ දෙය සිදු වුණා. එල්.ටී.ටී.ඊ. සංවිධානය ගැන කල්පනා කරන විටත් එහි පසුබිමේ කොටසක් මේ ප්‍රශ්නයට අදාලයි. මේ ගමන යන්නේ තරුණ පරම්පරාව විනාශ කරමින්. ඒ නිසා මෙයින් වලකින මුල් පියවර ගන්නේ කොහොමද?***

පිළිතුර : ඉන්දියාවේ ගාන්ධිතුමා වාගේ දේශපාලනයෙන් පිරිහිමට පත් නොවූ, ආදර්ශවත්, හොඳ පෞරුෂත්වයක් ඇති හොඳ දර්ශනයක් ඇති, සිවිල් සමාජ නායකයන් මේ රට තුළින් බිහිවිය යුතුයි. එක් යුගයක ධර්මපාලතුමා

අපේ රට ගොඩ නගන්න විශාල මෙහෙවරක් කළා. එතුමා පාර්ලිමේන්තුවට එන්න, ඡන්දය ලබා ගන්න ක්‍රියා කරන කෙනෙක් නොවෙයි කියන මහජන විශ්වාසය ඇති වුණා. අදත් ඒ ආකාරයේ ප්‍රජා නායකයන් බිහි විය යුතුයි. රටට යම්කිසි නායකත්වයක් දෙන්න හැකි එසේ කළහොත් පමණයි. මේ දේශපාලන පක්ෂ වල නායකයන් පිළිබඳව තිබෙන විශ්වාසය මිනිසුන් අතරින් ටිකෙන් ටික ගිලිහෙනවා. තරුණ පරම්පරාව එක් පැත්තකට යොමු වෙනවා. අද සිටින තරුණ පරම්පරාවට රට, ජාතිය, අපට වෙන්නේ කුමක්ද? කියන එක පිළිබඳ අවබෝධයක් නැහැ. සංගීත සංදර්ශන, නැටුම් ගැයුම් ආදී අමුතුම ආකාරයේ බටහිර සංස්කෘතියක් කරා ගමන් කරන පිරිසක් ද සිටිනවා. ඔවුන් රටට වෙන්නේ කුමක්ද? බඩු මිල ඉහළ යනවාද? රටේ නීතිය විනාශ වී යනවාද? පිළිබඳ කල්පනාවක් නැහැ. අද තියෙන්නේ කොතැන හෝ සංගීත සංදර්ශනයක් තිබෙනවා නම් එළිවනතුරු ඒවායේ නටමින් කටයුතු කරන සංස්කෘතියක්. ඒවාගේම සමාජ ශාලාවල කල් ගෙවමින් ලක්ෂ ගණනින් මුදල් වියදම් කරන එක්තරා ආකාරයක තරුණ පිරිසක් අද බිහිවෙලා.

*ප්‍රශ්නය : ඒ වගේම සමහර තරුණ තරුණියන් දැන් බුද්ධාගම පැත්තට නැඹුරු වෙනවා නේද?*

පිළිතුර : එයත් අද රටේ තිබෙන අසහනය නිසා ඇති වු දෙයක්. තරුණ පිරිස් වලට සහනයක් ඇති කර ගන්න වෙන ක්‍රමයක් නැති නිසා අද බොහෝ විහාරස්ථාන, දහම් පාසල් වලට තරුණ පිරිස් එනවා. විහාරස්ථාන වල ආගමික වතාවත් වලට සම්බන්ධ වෙලා ක්‍රියා කරන ප්‍රවණතාවයක් ඇති වෙලා තිබෙනවා. එය අපට තිබෙන එක සහනයක්. තරුණ සමාජයේ සෑහෙන පිරිසක් විහාරස්ථාන ඇසුරු කරමින්, ආගමික, සමාජ වැඩ වල යෙදෙන්න උද්යෝගයක් දක්වනවා. ඒ උනන්දුව ආරක්ෂා කර ගත යුතුයි. එය වැඩි දියුණු කිරීමට නිවැරදි වැඩපිළිවෙලක් නොතිබුණොත් අපේ උත්සාහය නිරර්ථක වෙන්න පුළුවන්. ඒ අයට සමාජ පිළිගැනීමක් ඇති කළ යුතුයි.

*ප්‍රශ්නය : ආගමික නායකයන් වශයෙන් මේ ගමන ඉදිරියට ගෙන යන්න ස්වාමින් වහන්සේලාට කරන්න පුළුවන් කුමක්ද?*

පිළිතුර : එක්දහස් නවසිය හතලිස් ගණන් වල, පනස් ගණන් වල භික්ෂූන් වහන්සේලා ලංකාවේ සමාජ පරිවර්තනයකට දායකත්වයක් දුන්න බව අපි සඳහන් කරනවා. නමුත් භික්ෂූන් වහන්සේලා දේශපාලනයට ලං වුවා වැඩියි කියා මාගේ එක්තරා ආකාරය කළකිරීමත් තිබෙනවා. ආණ්ඩු පත් කරන්නවත්, ආණ්ඩු බලයෙන් ඉවත් කරන්නවත් ව්‍යාපාර ගෙනයන්න මේ රටේ භික්ෂූන් වහ්නසේලාට අවශ්‍ය වෙන්නේ නැහැ කියන එක මගේ පුද්ගලික මතය. අපි කළයුත්තේ ආගමික මත ඔස්සේ ජනතාව දැනුවත් කිරීම පමණයි. මේ රටේ භික්ෂූන් වහන්සේලාට සමාජ කාර්ය භාරයක් ඉතිහාසයෙන්ම උරුම වුණා. මේ අය නොවෙයි. මේ අය බලයට පත් කරන්න අවශ්‍යයි කියලා කියන්න ගිය ගමනේ අවසානයේ අද භික්ෂුව පාර්ලිමේන්තුවට ප්‍රවේශ වන තත්ත්වයකට පැමිණ තිබෙනවා. මේ තුළ භික්ෂූන් වහන්සේට තිබූ ප්‍රතිරූපය එක්තරා ආකාරයකින් බිඳ වැටී තිබෙනවා. භික්ෂූන් වහන්සේලාට ඕනෑම දේශපාලනඥයෙක් ඉදිරියේ වැරදිනම් ''ඔබ වැරදියි'' හරි නම් ''ඔබ හරියි'' කියන්න හැකියාවක් තියෙන්න අවශ්‍යයි. උන්වහන්සේලා මතයක් දරා ගත්තාට පසු එහෙම කරන්න පුළුවන් කමක් නැහැ. අද ඒ අඩුව වෙලා තියෙනවා. භික්ෂු නායකත්වය තුළින් භික්ෂූන්වහන්සේලා අතර අද සම්මුතියක් ඇති විය යුතුයි. මේ රට අද ඇඳ වැටිලා තියෙන තත්ත්වයෙන් ගොඩ ගන්න කළ යුත්තේ කුමක්ද? ආගමික නායකයන් ලෙස මහ ජනතාව අපේ නායකත්වය විශ්වාස කරන ආකාරයට ක්‍රියා කළ යුත්තේ කෙසේද කියන එක පිළිබඳ කතිකාවක් ඇති කළ යුතුයි. භික්ෂූන් වහන්සේලා පමණ නොවෙයි, උන් වහන්සේලාට මේ රටේ අනෙකුත් ක්‍රිස්තියානු, හින්දු, මුස්ලිම් ආගමික නායකයන්ද සමඟ එකට කටයුතු කරන්න හැකියාවක් තිබිය යුතුයි. ''අපේ ආගම් ඉතිරි වන්නේ මේ රටේ මිනිස්සු ශිලාචාරව, සදාචාර සම්පන්නව ආර්ථික වශයෙන් ශක්තිමත් ජීවත් වුනොත්

පමණයි. ඒ නිසා මිනිස්සුන්ට තිබෙන මානව ප්‍රශ්න කෙරෙහි අපි එක මතයක සිට කටයුතු කරමු'' කියන මතයට එන්න අවශ්‍යයි.

*ස්තූතියි ස්වාමින්වහන්ස.*